# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2028/2 - 2017 ජූලි මස 17 වැනි සඳුදා - 2017.07.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### වන්දනා ගමන් ආඥාපනත

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සීනිගම ග්‍රාම නිලධාරි වසමේ සීනිගම ශ්‍රී දෙවොල් මහා දේවාලයේ වාර්ෂික ඇසළ උත්සවය අගෝස්තු මස 24 වැනි බ්‍රහස්පතින්දා දින සිට 31 බ්‍රහස්පතින්දා දින දක්වා පවත්වනු ලබන බව වන්දනා ගමන් ආඥාපනතේ 2 වැනි වගන්තිය අනුව (175 වන අධිකාරය වූ) රෙගුලාසි ප්‍රකාරව අංක 1965/39 හා 2016.05.06 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* යටතේ සාදනු ලබන නියෝග අනුව මෙයින් දන්වමි.

එස්. ටී. කොඩිකාර,
දිස්ත්‍රික් ලේකම්/දිසාපති,
ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කය.

2017 ජූලි මස 11 වැනි දින,
ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

08 - 01

---

නිවැරදි කිරීමයි.

### රාජ්‍ය සේවා කොමිෂන් සභාව

2017.04.26 දින අංක 2016/37 *අති විශෙෂ ගැසට් පත්‍රයේ* I වැනි කොටස (I) වැනි ඡේදය - සාමාන්‍ය, රජයේ නිවේදන යටතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පැවරීමට අදාළ කෙටුම්පත් *ගැසට් පත්‍රයෙහි* සිංහල භාෂාවේ පිටු අංක 2A හි I වන තීරුවේ අංක 19 යටතේ පළ වී ඇති නිලධාරි ගණය, මුද්‍රණ දෝෂයකින් මෙලෙස පළවී ඇත.

''සංචාරක බංගලා භාරකරුවන් සහ පන්තියට පහළ නිලධාරීන් සහායක සංචාරක බංගලා භාරකරුවන්''

එය ''සංචාරක බංගලා භාරකරුවන් සහ සහායක සංචාරක බංගලා භාරකරුවන්'' ලෙස නිවැරදි විය යුතු ය.

එච්. එම්. ගාමිණී සෙනෙවිරත්න,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
අංක 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ 05.

08 - 02

1A - G 25903 — 17 (2017/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*